# ථේරවාදී බුදුදහම ජාත්‍යන්තරයට රැගෙන යාමෙහි ලා ධර්මපාලතුමන් අනුගමනය කළ ක්‍රමෝපාය

**බිහේෂ් ඉන්දික සම්පත්**[1]
[1]*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
**bihesh@gmail.com*

අනගාරික ධර්මපාලතුමා (1864.09.17-1933.04.29) විසින් ථේරවාදී බුදුදහම ජාත්‍යන්තරයට රැගෙන යාමෙහි ලා අනුගමනය කරන ලද ක්‍රමෝපාය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි අරමුණ යි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මුද්‍රිත පොත - පත හා අන්තර්ජාලගත තොරතුරු ඇසුරු කොට ගනිමින් සිදු කෙරෙන මෙම අධ්‍යයනය තුළින් හඳුනා ගැනෙන තොරතුරු වර්තමානයේ දී ද ජාත්‍යන්තර වශයෙන් බුදුදහම ව්‍යාප්තියෙහි ලා යොදා ගත හැකි වේ ද යන කරුණ පිළිබඳ ව ද මෙහි දී අවධානය යොමු කෙරේ. ධර්මපාලතුමන් මෙම කාර්යයෙහි ලා පළමු කොට සිදු කළ කාර්යය නම් බුදුදහම හා බැඳුණු ප්‍රධාන භාෂාව වන පාලි භාෂාවත් ජාත්‍යන්තරය හා සම්බන්ධතා පවත්වා ගැනීමෙහි ලා ප්‍රධාන වශයෙන් ඉවහල් වන්නා වූ ඉංග්‍රීසි භාෂාවත් ඉතා හොඳින් ප්‍රගුණ කිරීම යි. සිංහල භාෂාවට අමතර ව සංස්කෘත භාෂාව ද ඔහු හොඳින් දැන සිටියේ ය. ඔහු ථේරවාදී බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරු මෙන් ම තත්කාලීන ව පැවැති ආගමික වාද විවාද ආදිය ද මැනවින් අධ්‍යයනය කොට තිබේ. බෞද්ධ දර්ශනය හා බැඳුණු සමාජ සංසිද්ධි තාර්කික ව විශ්ලේෂණය කිරීමේ ශක්‍යතාව උපදවා ගත් ඔහු චිකාගෝ දෘෂ්ටි සම්මේලනය (1893) ඇතුළු ජාත්‍යන්තර සමුළු ද නියෝජනය කළේ ය. මේරි ෆෝස්ටර් වැනි විදේශීයයන් බුදුදහම කෙරෙහි ආකර්ෂණය කර ගැනීම, ඔවුන් ගේ ධන පරිත්‍යාගයන් තම ආගමික සේවාව ව්‍යාප්ත කිරීමෙහි ලා යොදා ගැනීම, මහාබෝධි සමාගම ආරම්භ කොට ඉන්දියාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව වැනි රටවල ද එහි ශාඛා ස්ථාපිත කිරීම වැනි ජාත්‍යන්තර කර්තව්‍යයන් උදෙසා ඔහු තුළ පැවැති මනා පෞරුෂය ද ඉවහල් වූ බව පැහැදිලි ය. බුද්ධගයාව හින්දූන්ගෙන් නිදහස් කර ගැනීම වැනි අවස්ථාවල දී ජාත්‍යන්තර වශයෙන් නීතිමය තත්ත්වයන්ට මුහුණ දීමේ දී ඔහු තුළ පැවැති සූක්ෂ්ම හැකියා ප්‍රකට වේ. ධර්මපාලතුමන් විදේශ රටවල බෞද්ධ දර්ශනය ව්‍යාප්ත කළේ හුදු මූලධර්මවාදී සමයාන්තර ප්‍රයාණයක් වශයෙන් නො ව එම සමාජයන් ගේ අවශ්‍යතාවක් සම්පාදනය කොට දීමක් වශයෙනි. මේ ආකාරයට භාෂාත්මක අවබෝධය, ධර්මානුකූල අධ්‍යාපනය හා සමාජ භාවිතය, පෞරුෂයේ ආකර්ෂණීය භාවය, ගැඹුරු දේශනා ශෛලිය, සබඳතා ගොඩනඟා ගැනීමේ ශක්‍යතාව, නීතියේ විශාරද භාවය, මූලධර්මවාදී නොවීම ආදි විශේෂතා ධර්මපාලතුමන් බුදුදහම ජාත්‍යන්තරයේ පතුරුවා හැරීමේ ක්‍රියාවලිය තුළ දක්නට ලැබේ.

මුඛ්‍ය පද ඃ ථේරවාදය, බුදුදහම, ජාත්‍යන්තරය, ධර්මපාල, මහාබෝධි සමාගම